දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

කෝට්ටේ ලේකම් / செயலாளர் / Secretary } 2784812

Kotte කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ED/01/12/14/01/01

ඔබේ අංකය / உமது இல. / Your No. } ............................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**
'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුර
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura
Battaramulla.
පාසල් කටයුතු ශාඛාව

මගේ අංකය / எமது இல / My No. }

දිනය / திகதி / Date } 2017.07.21

**චක්‍රලේඛ අංක: 29/2017**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පාසල්වල විදුහල්පතිවරුන්,

## සුභග සිසුන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන

**01.** අනාගත අභියෝග ජය ගැනීම සඳහා අවශ්‍ය වන විභව්‍යතාවලින් යුත් නිර්මාණශීලී තරුණ පරපුරක් බිහිකරලීම උදෙසා විවිධ ක්ෂේත්‍රවලින් සුවිශේෂ කුසලතා දක්වන පාසල් සිසුන් තුළ එවන් කුසලතා තවදුරටත් ප්‍රවර්ධනය කිරීමේ අරමුණ පෙරදැරි ව 2017 අයවැය යෝජනා අනුව යෝජිත පරිදි මෙම සුභග ශිෂ්‍යත්ව වැඩසටහන 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ යටතේ ආරම්භක පියවර ලෙස ද්විතියික අධ්‍යාපන අවධියේ සුවිශේෂ දක්ෂතා ප්‍රදර්ශනය කළ හා අදාළ වර්ෂයේ 12වන ශ්‍රේණියට ඇතුළත් ව අ.පො.ස.(උසස් පෙළ) අධ්‍යාපනය ආරම්භ කරන සිසුන් අතරින් තෝරා ගත් සිසුන් 1000කට මාස 20ක කාල සීමාවක් සඳහා රු.50,000ක වටිනාකමින් යුතු ශිෂ්‍යත්ව සමාන වාරික 20කින් පිරිනමනු ලැබේ.

**02.** අරමුණු

2.1 සුභග සිසුන්ගේ සුවිශේෂ කුසලතා සංවර්ධනය කරමින් පාසල් අධ්‍යාපන ඉලක්ක සපුරා ගැනීමට අවස්ථා ලබා දීම.

2.2 රටෙහි සංවර්ධනයට සුවිශේෂ දායකත්වයක් ලබා දිය හැකි වන පරිදි විවිධ ක්ෂේත්‍ර ඔස්සේ සුවිශේෂ දක්ෂතා දක්වන සිසුන්හට එම කුසලතා තව දුරටත් වැඩි දියුණු කර ගැනීම සඳහා දිරි ගැන්වීම.

**03. ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය මූලික සුදුසුකම්**

3.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

3.2 අදාළ වර්ෂයේ දී රජයේ පාසලක අ.පො.ස(උ.පෙළ) හැදෑරීම සඳහා අවම සුදුසුකම් සහිත ව සමත් ව, දැනට අ.පො.ස. (උ.පෙළ) හැදෑරීම ආරම්භ කරන ලද 12වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක විය යුතු ය.

3.3 යහපත් චරිතයකින් යුක්ත ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක විය යුතු ය.

3.4 අයදුම්කරු ඉල්ලුම් කරනු ලබන ක්ෂේත්‍රයට අදාළ ක්‍රියාකාරකම්වල අඛණ්ඩ ව නිරත විය යුතු ය.

## 04. අයදුම්පත් ඉදිරිපත් කිරීම

4.1 මේ සම්බන්ධ ව අදාළ අයදුම්පත්‍රයේ ආකෘතියක් (ඇමුණුම 01) සහිත දැන්වීමක් රජයේ පුවත්පත්වල පළ කරනු ලැබේ. එම ආකෘතියට අනුව සිසුන් විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත් පිටපත් දෙකකින් යුක්ත ව, අදාළ සහතිකවල පිටපත් ද සමඟ 2017.09.06 දිනට පෙර දැනට අ.පො.ස. (උ.පෙළ) ඉගෙනුම ලබන පාසලේ විදුහල්පති වෙත යොමු කළ යුතු ය. අ.පො.ස. (උ.පෙළ) හැදෑරීම සඳහා වෙනත් පාසලකට ඇතුළත් වී සිටින සිසුන් තමා, අ.පො.ස (සා.පෙළ) හැදෑරූ පාසලේ විදුහල්පති නිර්දේශය ද සහිත ව අ.පො.ස. (උ.පෙළ) හදාරනු ලබන පාසලේ විදුහල්පති වෙත අයදුම්පත් බාර දිය යුතු ය.

4.2 මෙම ශිෂ්‍යත්වය ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය (ඇමුණුම 01) හා ඊට අදාළ උපදෙස් පාසලේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමට විදුහල්පතිවරුන් වග බලා ගත යුතු ය.

4.3 නියමිත දිනට පසු ව පාසලට ලැබෙන අයදුම්පත් හා අදාළ අයදුම්පතෙහි සඳහන් සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සහතිකවල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.4 මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය පහත සඳහන් පරිදි විශේෂ කාණ්ඩ 3ක් ප්‍රධාන කොට සිදු කෙරේ.

I. කාණ්ඩ අංක 01- නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

II. කාණ්ඩ අංක 02 - සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

III. කාණ්ඩ අංක 03 - ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ

කාණ්ඩ කිහිපයකින් ඉල්ලුම් කරන්නේ නම් එක් එක් කාණ්ඩය යටතේ වෙන් වෙන් වශයෙන් ඉල්ලුම් කළ යුතු ය.

4.5 ඉහත 03 ඡේදයට අනුව මූලික සුදුසුකම් සපුරාලන ශිෂ්‍යයකුට/ශිෂ්‍යාවකට තම සුවිශේෂී දක්ෂතා මත 4.4 හි සඳහන් ඕනෑ ම කාණ්ඩයක් යටතේ ඉල්ලුම් කළ හැකි ය.

## 05. තෝරා ගැනීමේ ක්‍රමවේදය

මෙම චක්‍රලේඛයේ 06 පරිච්ඡේදයේ සඳහන් ලකුණු පටිපාටියට අනුකූලව පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කරමින්, එක් එක් මට්ටමේ දී අයදුම්පත් හා සහතික මැනවින් පරීක්ෂා කර අයදුම්පතෙහි පිටපත් දෙකෙහි ම අදාළ තීරුවේ ලකුණු සටහන් කළ යුතු ය.

### 5.1 පාසල් මට්ටම

I. පාසලට ලැබෙන අයදුම්පත් සියල්ලෙහිම මූලික තොරතුරු ලේඛනගත කර පවත්වා ගත යුතුය (සී.ආර් පොතක හා/හෝ පරිගණකගත කර).

II. විදුහල්පතිගේ සභාපතිත්වයෙන් හා ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් දෙදෙනෙකුගේ සාමාජිකත්වයෙන් යුත් (තිදෙනකුගෙන් සමන්විත) පාසල් තේරීම් කමිටුවක් විසින්

අයදුම්පත් පරීක්ෂා කර ප්‍රදානය කරන ලකුණු, අයදුම්පතෙහි ලකුණු තීරුව 01හි සඳහන් කළ යුතු ය.

III. පාසලට ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව 150කට වඩා සැලකිය යුතු සංඛ්‍යාවක් ඉක්ම වූ අවස්ථාවකදී පමණක් අයදුම්පත් පරීක්ෂා කිරීමේ කඩිනම් බව, නිරවද්‍ය බව හා පහසුව සලකා සුදුසු පරිදි නියෝජ්‍ය/ සහකාර විදුහල්පතිවරයෙකු හෝ අංශ ප්‍රධානි/ ශ්‍රේණි ප්‍රධානි ගුරුවරයෙකුගේ සභාපතිත්වයෙන් යුතු පාසල් තේරීම් කමිටු එකකට වඩා පත්කර ගත හැකිය. එසේ වුව ද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත තෝරා ගත් සිසුන්ගේ නාම ලේඛන යොමු කිරීමේ දී විදුහල්පති විසින් අදාළ කමිටු මඟින් තෝරා ගත් ශිෂ්‍ය නාම ලේඛනවල නිරවද්‍ය බව සහතික කළ යුතු ය.

IV. ඒ ඒ කාණ්ඩය යටතේ එක් එක් ශිෂ්‍යයා/ශිෂ්‍යාව සඳහා ලබා දී ඇති ලකුණු 100න් අවම වශයෙන් පහත සඳහන් පරිදි ලකුණු 25ක් හෝ ඊට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් තෝරා ගත යුතු ය.

| | | |
|---|---|---|
| විශේෂ නිර්ණායක මඟින් | - ලකුණු 10 හෝ ඊට වැඩි | ලකුණු 25 හෝ ඊට වැඩි |
| පොදු නිර්ණායක I හා II මඟින් | - ලකුණු 15 හෝ ඊට වැඩි | |

V. එක් එක් කාණ්ඩය යටතේ ලකුණු 25 හෝ ඊට වැඩි ලකුණු ලබා ගන්නා ලද තෝරා ගත් අයදුම්කරුවන්ගේ නාම ලේඛන වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02 (A) ආකෘතියට අනුකූල ව මුළු ලකුණු අවරෝහණ අනුපිළිවෙලට සකස් කළ යුතු ය. එම ආකෘතිය සමඟ එහි ඇතුළත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් හා සහතිකවල පිටපත් අනුපිළිවෙලින් සකස් කර විදුහල්පති විසින් සහතික කර එක් අයදුම්පතක් 2017.09.12 දිනට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු ය. එහි අනෙක් පිටපත පාසලේ සුරක්ෂිත ව තබා ගත යුතු ය.

### 5.2 කලාප මට්ටම

I. මෙම චක්‍රලේඛයේ ඇමුණුම 02 (A) ආකෘතිය සමඟ ඒ ඒ පාසලෙන් ලැබෙන අයදුම්පත් හා ආශ්‍රිත සහතික/ ලේඛන පහත සඳහන් පරිදි පරීක්ෂා කළ යුතු ය.

II. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අධීක්ෂණයෙන්, ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකුගේ සභාපතිත්වයෙන් හා තවත් මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුගේ සාමාජිකත්වයෙන් යුත් (තිදෙනකුගෙන් සමන්විත) සමාන්තර කලාප තේරීම් කමිටු පිහිටුවා සම්මුඛ පරීක්ෂණ පැවැත්විය යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රදානය කරන ලකුණු අයදුම්පතෙහි ලකුණු තීරුව 02හි සඳහන් කළ යුතු ය.

III. කලාප අධ්‍යාපන කාර්යාලයට ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව 50කට වඩා සැලකිය යුතු සංඛ්‍යාවක් ඉක්මවූ අවස්ථාවකදී පමණක් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ කඩිනම් බව, නිරවද්‍ය බව හා පහසුව සලකා සුදුසු පරිදි කලාප තේරීම් කමිටු එකකට වඩා පත්කර ගත හැකි ය. එසේ වුව ද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත තෝරා ගත් සිසුන්ගේ නාම ලේඛන යොමු කිරීමේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ කමිටු මඟින් තෝරා ගත් ශිෂ්‍ය නාම ලේඛනවල නිරවද්‍ය බව සහතික කළ යුතු ය.

IV. කලාප අධ්‍යාපන කාර්යාලයේ පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ සඳහා සිසුන් කැඳවීම අදාළ පාසල්වල විදුහල්පතිවරු මඟින් සිදු කළ යුතු ය. කලාප අධ්‍යාපන කාර්යාල මඟින්

විධිමත්ව සම්මුඛ පරීක්ෂණ පැවැත්විය යුතු ය. මෙහි දී සහතිකපත්වල මුල් පිටපත්/නිර්මාණ ආදී ලකුණු තහවුරු කර ගැනීමට අදාළ සියලු කරුණු පරීක්ෂා කිරීමෙන් අනතුරුව ලකුණු ප්‍රදානය කළ යුතු ය.

V. අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලබන දින හා වේලාව කලාප අධ්‍යාපන කාර්යාලයේ හා අදාළ පාසල්වල දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය.

VI. ඒ ඒ කාණ්ඩය යටතේ එක් එක් ශිෂ්‍යයා/ශිෂ්‍යාව සඳහා ලබා දී ඇති ලකුණු 100න් අවම වශයෙන් පහත සඳහන් පරිදි ලකුණු 35ක් හෝ ඊට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් තෝරා ගත යුතු ය.

| | | |
|---|---|---|
| විශේෂ නිර්ණායක මඟින් | - ලකුණු 15 හෝ ඊට වැඩි | ලකුණු 35 හෝ ඊට වැඩි |
| පොදු නිර්ණායක I හා II මඟින් | - ලකුණු 20 හෝ ඊට වැඩි | |

VII. මෙහි දී කලාප තේරීම් කමිටුව විසින් ලබා දෙනු ලබන සම්මුඛ පරීක්ෂණ ලකුණු හා පාසල් තේරීම් කමිටුව විසින් ලබා දී ඇති ලකුණුවල යම් වෙනසක් ඇත්නම් කලාප තේරීම් කමිටුව මඟින් ලබා දෙන ලකුණු නිරවද්‍ය ලෙස පිළිගනු ලැබේ.

VIII. එක් එක් කාණ්ඩය යටතේ ලකුණු 35 හෝ ඊට වැඩි ලකුණු ලබා ගන්නා ලද තෝරා ගත් අයදුම්කරුවන්ගේ නාම ලේඛන වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02 (B) ආකෘතියට අනුකූල ව මුළු ලකුණු අවරෝහණ අනුපිළිවෙළට සකස් කළ යුතු ය. එම ආකෘතිය සමඟ එහි ඇතුළත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් හා සහතිකවල පිටපත් අනුපිළිවෙළින් සකස් කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර 2017.09.25 දිනට පෙර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු ය.

## 5.3 පළාත් මට්ටම

I. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අධීක්ෂණයෙන් ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකුගේ සභාපතිත්වයෙන් හා තවත් මාණ්ඩලික නිලධාරීන් දෙදෙනකුගේ සාමාජිකත්වයෙන් යුත් (තිදෙනකුගෙන් සමන්විත) සමාන්තර පළාත් තේරීම් කමිටු පිහිටුවා අයදුම්පත් පරීක්ෂා කර ප්‍රදානය කරන ලකුණු අයදුම්පතෙහි ලකුණු තීරුව 03හි සඳහන් කළ යුතු ය.

II. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව 150කට වඩා සැලකිය යුතු සංඛ්‍යාවක් ඉක්ම වූ අවස්ථාවකදී පමණක් අයදුම්පත් පරීක්ෂා කිරීමේ කඩිනම් බව, නිරවද්‍ය බව හා පහසුව සලකා සුදුසු පරිදි කමිටු එකකට වඩා පත්කර ගත හැකිය. එසේ වුව ද අධ්‍යාපන අමාත්‍යාංශය වෙත තෝරා ගත් සිසුන්ගේ නාම ලේඛන යොමු කිරීමේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ කමිටු මඟින් තෝරා ගත් ශිෂ්‍ය නාම ලේඛන නිරවද්‍ය බවට සහතික කළ යුතු ය.

III. එක් කාණ්ඩයකින් සිසුන් 50 බැගින් ඉහළ ම ලකුණු ලබා ගත් සිසුන් 150 දෙනෙකු තෝරා ගත යුතු අතර , යම් කාණ්ඩයකින් නියමිත සංඛ්‍යාව සපුරා නොමැති නම් පමණක් අනෙකුත් කාණ්ඩ යටතේ එම සංඛ්‍යාව සමානුපාතික ව බෙදෙන පරිදි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව තෝරා ගත යුතු ය.

IV. ඒ අනුව, එක් එක් කාණ්ඩය යටතේ තෝරා ගත් අයදුම්කරුවන්ගේ නාම ලේඛන ඇමුණුම 02 (C) ආකෘතියට අනුකූල ව වෙන් වෙන් ව මුළු ලකුණු අවරෝහණ

අනුපිළිවෙලට සකස් කළ යුතු ය. එම ආකෘතිය සමඟ එහි ඇතුළත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් හා සහතිකවල පිටපත් අනුපිළිවෙලින් සකස් කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර 2017.10.02 දිනට පෙර අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු ය.

5.4 ජාතික මට්ටම

I. පළාත් මට්ටමින් යොමු කෙරෙන යෝජිත ශිෂ්‍යත්වලාභීන්ගේ නාම ලේඛන හා අයදුම්පත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පරීක්ෂා කර එක් එක් කාණ්ඩය යටතේ ඉහළ ම ලකුණු ලබා ගත් සිසුන් 1000ක් තෝරා ගත යුතු ය.

II. එක් එක් පළාත සඳහා නිශ්චිත ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාවක් වෙන් නොකරනු ලබන අතර ජාතික මට්ටමින් සලකා අදාළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව තෝරා ගනු ලැබේ.

III. එසේ තෝරා ගනු ලබන ශිෂ්‍යත්වලාභීන් සඳහා සුහද ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබේ.

5.5 ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක කාණ්ඩ කිහිපයකින් ශිෂ්‍යත්වය සඳහා ඉල්ලුම් කළ ද එක් කාණ්ඩයකින් පමණක් මෙම ශිෂ්‍යත්වය ලැබීම සඳහා හිමිකම් ලබනු ඇත.

5.6 සුහද ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කරනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දක්ෂතා සලකා බලා එක් එක් කාණ්ඩය යටතේ ලබා දෙනු ලබන ශිෂ්‍යත්ව සංඛ්‍යාව තීරණය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය සතු ය.

5.7 අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අවසාන වශයෙන් තෝරා ගත් ශිෂ්‍යත්වලාභීන්ව ශිෂ්‍යත්ව සඳහා තෝරා ගත් බවට අදාළ පාසල්වල විදුහල්පතිවරුන් මඟින් දැනුවත් කරනු ඇත.

## 06. තෝරා ගැනීම සඳහා උපයෝගී කර ගන්නා කාණ්ඩ, නිර්ණායක හා අදාළ ලකුණු පටිපාටිය

4.3 හි සඳහන් පරිදි කාණ්ඩ 03ක් සඳහා එනම්, නව නිපැයුම්, ක්‍රීඩා හා සෞන්දර්ය යන කාණ්ඩ පදනම් කර ගෙන විශේෂ නිර්ණායක හා පොදු නිර්ණායක යටතේ ලකුණු ලබා දීම සිදු කරයි.

මෙහි දී, ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක අදාළ වර්ෂයට ආසන්න අනුයාත වර්ෂ 4ක් තුළ දී ලබා ගත් ජයග්‍රහණ පමණක් සලකා බැලිය යුතු ය.

**I. විශේෂ නිර්ණායක - උපරිම ලකුණු 40**

මේ යටතේ ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක පහත සඳහන් ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයක් සඳහා පමණක් දක්වන ලද දක්ෂතා ඇගයීමට ලක් කළ යුතු ය.

අ) නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

ආ) සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

ඇ) ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ

**II. පොදු නිර්ණායක I කොටස - උපරිම ලකුණු 20**

ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක තමන් අයදුම් කරන කාණ්ඩය හැර අනෙක් කාණ්ඩ දෙකෙන් දක්වා ඇති දක්ෂතා අදාළ පරිදි පොදු නිර්ණායක 01 යටතේ සඳහන් නිර්ණායක මඟින් ඇගයීමට ලක් කළ යුතු ය.

මෙහි දී, අයදුම් කරනු ලබන කාණ්ඩයට අදාළ විශේෂ නිර්ණායකය සඳහා ලකුණු ලබා නොදිය යුතු ය.

අ) කාණ්ඩ අංක 01 - සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ හා ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ

ආ) කාණ්ඩ අංක 02 - නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ හා ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ

ඇ) කාණ්ඩ අංක 03 - නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ හා සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

## III. පොදු නිර්ණායක II කොටස - උපරිම ලකුණු 40

ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා පෙන්වා ඇති දක්ෂතා පොදු නිර්ණායක II යටතේ ඇගයීමට ලක් කළ යුතු ය.

අ) අන්තර් ජාතික මට්ටමේ දක්ෂතා
ආ) විෂය සමගාමී ක්‍රියාකාරකම්
ඇ) භාෂා, ගණිතය, විද්‍යාව ඇතුළු අනෙකුත් විෂයයන් ආශ්‍රිත ක්‍රියාකාරකම්
ඈ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරකම්
ඉ) නිර්මාණශීලිත්වය ආශ්‍රිත ක්‍රියාකාරකම්
ඊ) අ.පො.ස.(උ.පෙළ)ට ඇතුළත් වීමට අදාළ අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල

එක් එක් කාණ්ඩය යටතේ ඇති නිර්ණායක සඳහා ලබා දිය යුතු ලකුණු සාරාංශය වගු අංක 01හි සඳහන් කර ඇති අතර අදාළ ලකුණු ලබා දීමේ පටිපාටිය 6.1 හා 6.2 යටතේ දක්වා ඇත.

වගු අංක 01 : නිර්ණායක සඳහා ලබා දිය යුතු ලකුණු

| නිර්ණායක | කාණ්ඩ අංක 01 | කාණ්ඩ අංක 02 | කාණ්ඩ අංක 03 |
|---|---|---|---|
| විශේෂ නිර්ණායක (උපරිම ලකුණු 40) | නව නිපැයුම්/විද්‍යාත්මක පර්යේෂණ සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 40) | සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 40) | ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 40) |
| පොදු නිර්ණායක I (උපරිම ලකුණු 20) | i. සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 10) | i. නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 10) | i. නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 10) |
| | ii. ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 10) | ii. ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 10) | ii. සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 10) |
| පොදු නිර්ණායක II (උපරිම ලකුණු 40) | iii. අන්තර්ජාතික මට්ටමේ දක්ෂතා (ලකුණු 07) | iii. අන්තර්ජාතික මට්ටමේ දක්ෂතා (ලකුණු 07) | iii. අන්තර්ජාතික මට්ටමේ දක්ෂතා (ලකුණු 07) |
| | iv. විෂය සමගාමී ක්‍රියාකාරකම් (ලකුණු 08) | iv. විෂය සමගාමී ක්‍රියාකාරකම් (ලකුණු 08) | iv. විෂය සමගාමී ක්‍රියාකාරකම් (ලකුණු 08) |

| | | | |
|---|---|---|---|
| | v. භාෂා,ගණිතය, විද්‍යාව ඇතුළු අනෙකුත් විෂයයන් ආශ්‍රිත ක්‍රියාකාරකම් (ලකුණු 10) | v. භාෂා,ගණිතය, විද්‍යාව ඇතුළු අනෙකුත් විෂයයන් ආශ්‍රිත ක්‍රියාකාරකම් (ලකුණු 10) | v. භාෂා,ගණිතය, විද්‍යාව ඇතුළු අනෙකුත් විෂයයන් ආශ්‍රිත ක්‍රියාකාරකම් (ලකුණු 10) |
| | vi. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරකම් (ලකුණු 05) | vi. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරකම් (ලකුණු 05) | vi. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරකම් (ලකුණු 05) |
| | vii. නිර්මාණශීලිත්වය ආශ්‍රිත ක්‍රියාකාරකම් (ලකුණු 05) | vii. නිර්මාණශීලිත්වය ආශ්‍රිත ක්‍රියාකාරකම් (ලකුණු 05) | vii. නිර්මාණශීලිත්වය ආශ්‍රිත ක්‍රියාකාරකම් (ලකුණු 05) |
| | viii. අ.පො.ස.(උ.පෙ.ළ)ට ඇතුළත් වීමට අදාළ අ.පො.ස (සා.පෙළ) ප්‍රතිඵල (ලකුණු 05) | viii. අ.පො.ස.(උ.පෙළ)ට ඇතුළත් වීමට අදාළ අ.පො.ස (සා.පෙළ)ප්‍රතිඵල (ලකුණු 05) | viii. අ.පො.ස.(උ.පෙළ)ට ඇතුළත් වීමට අදාළ අ.පො.ස (සා.පෙළ)ප්‍රතිඵල (ලකුණු 05) |
| | **මුළු ලකුණු 100** | **මුළු ලකුණු 100** | **මුළු ලකුණු 100** |

## 6.1 විශේෂ නිර්ණායක

### 6.1.1 කාණ්ඩ අංක 01 - නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

නව නිපැයුම්/විද්‍යාත්මක පර්යේෂණ ආශ්‍රිතව දක්වා ඇති කුසලතා සඳහා පහත වගු අංක 02 පරිදි ලකුණු ප්‍රදානය කළ යුතු ය. මෙහි දී උපරිම ලකුණු ලද එක් අවස්ථාවක් පමණක් සලකා බැලිය යුතු ය.

වගු අංක 02 : නව නිපැයුම් සඳහා ලකුණු ලබා දීම

| අනු අංකය | තරගය | මට්ටම | ස්ථානය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අන්තර්ජාතික තරගවලින් ප්‍රථම,දෙවන හා තෙවන ස්ථාන | | | 40 |
| 02 | අන්තර්ජාතික තරග සඳහා සහභාගිත්වය | | | 38 |
| 03 | පේටන්ට් බලපත්‍ර ලබා තිබීම | | | 36 |
| 04 | නව නිපැයුම්/විද්‍යාත්මක පර්යේෂණ | ජාතික මට්ටම | 1 ස්ථානය | 36 |
| 05 | | | 2 ස්ථානය | 34 |
| 06 | | | 3 ස්ථානය | 32 |
| 07 | | | කුසලතා | 30 |
| 08 | | | ඉදිරිපත් වීම | 28 |
| 09 | | පළාත් මට්ටම | 1 ස්ථානය | 25 |
| 10 | | | 2 ස්ථානය | 20 |
| 11 | | | 3 ස්ථානය | 15 |
| 12 | | | ඉදිරිපත් වීම | 12 |
| 13 | | කලාප මට්ටම | 1 ස්ථානය | 10 |
| 14 | | | 2 ස්ථානය | 08 |
| 15 | | | 3 ස්ථානය | 04 |

උපරිම ලකුණු 40

### 6.1.2 කාණ්ඩ අංක 02 - සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාව විසින් මෙහෙයවනු ලබන සෞන්දර්ය තරගවලින් අදාළ වර්ෂයට ආසන්න අනුයාත වසර 4ක් තුළ දී වගු අංක 03හි සඳහන් පරිදි උපරිම වශයෙන් කේවල හා /හෝ කණ්ඩායම් තරග සඳහා උපරිම ලකුණු ලද අවස්ථා දෙකක් පමණක් සලකා බැලිය යුතු ය.

වගු අංක 03: සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දීම

| අනු අංකය | ඒකල/ සමූහ | මට්ටම | ස්ථානය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අන්තර්ජාතික ඒකල තරගවලින් ප්‍රථම,දෙවන හා තෙවන ස්ථාන | | | 20 |
| 02 | අන්තර්ජාතික සමූහ තරගවලින් ප්‍රථම,දෙවන හා තෙවන ස්ථාන | | | 19 |
| 03 | ඒකල | ජාතික | 1 | 18 |
| 04 | | | 2 | 16 |
| 05 | | | 3 | 14 |
| 06 | | පළාත් | 1 | 12 |
| 07 | | | 2 | 09 |
| 08 | | | 3 | 06 |
| 09 | සමූහ | ජාතික | 1 | 14 |
| 10 | | | 2 | 12 |
| 11 | | | 3 | 10 |
| 12 | | පළාත් | 1 | 08 |
| 13 | | | 2 | 05 |
| 14 | | | 3 | 02 |

උපරිම ලකුණු 40

### 6.1.3. කාණ්ඩ අංක 03 -ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ

අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා ශාඛාව මගින් හෝ එම ශාඛාවේ සම්බන්ධීකරණයෙන් හෝ පවත්වනු ලැබූ ක්‍රීඩා තරගවලින් අදාළ වර්ෂයට ආසන්න අනුයාත වසර 4ක් තුළ දී වගු අංක 04හි සඳහන් පරිදි උපරිම වශයෙන් කේවල හා /හෝ කණ්ඩායම් තරග සඳහා උපරිම ලකුණු ලද අවස්ථා දෙකක් පමණක් සලකා බැලිය යුතු ය.

වගු අංක 04: ක්‍රීඩා ජයග්‍රහණ සඳහා ලකුණු ලබා දීම

| අනු අංකය | කේවල/කණ්ඩායම් | මට්ටම | ස්ථානය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අන්තර්ජාතික කේවල තරගවලින් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන | | | 20 |
| 02 | අන්තර්ජාතික කණ්ඩායම් තරගවලින් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන | | | 19 |
| 03 | කේවල | ජාතික | 1 | 18 |
| 04 | | | 2 | 16 |
| 05 | | | 3 | 14 |
| 06 | | පළාත් | 1 | 12 |
| 07 | | | 2 | 09 |
| 08 | | | 3 | 06 |

| | | | | |
|---|---|---|---|---|
| 09 | කණ්ඩායම් | ජාතික | 1 | 14 |
| 10 | | | 2 | 12 |
| 11 | | | 3 | 10 |
| 12 | | පළාත් | 1 | 08 |
| 13 | | | 2 | 05 |
| 14 | | | 3 | 02 |

**උපරිම ලකුණු 40**

## 6.2 පොදු නිර්ණායක -

### 6.2.1 පොදු නිර්ණායක I කොටස

#### 6.2.1.1 සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ-

අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අංශය මෙහෙයවන **සමස්ත** ලංකා සෞන්දර්ය තරඟවලින් ඒකල හෝ සමූහ තරඟ සඳහා අදාළ වර්ෂයට ආසන්න අනුයාත වසර 4ක් තුළ දී ලත් ජයග්‍රහණ තුනක් පමණක් සලකා බැලිය යුතු ය. (වෙනත් ආයතන විසින් මෙහෙයවනු ලබන තරඟ අදාළ නොවේ).

වගු අංක 05: සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දීම (පොදු නිර්ණායක)

| ස්ථානය | එක් තරඟයක් සඳහා ලකුණු* |
|---|---|
| 1 | 3 |
| 2 | 2 |
| 3 | 1 |

* ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක යථෝක්ත වසරවල දී සහභාගී වූ තරඟ අතරින් පළමු ස්ථාන තුනක් හෝ ඊට වැඩි ගණනක් ලබා ගෙන ඇත්නම් ප්‍රසාද ලකුණක් ඇතුළු ව ලකුණු 10ක් ලබා දෙනු ලැබේ.

**උපරිම ලකුණු 10**

#### 6.2.1.2 නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

නව නිර්මාණ/විද්‍යාත්මක පර්යේෂණ ආශ්‍රිතව ජාතික මට්ටමේ දක්වා ඇති කුසලතා අනුව පහත වගු අංක 06හි පරිදි එක් නිර්මාණයක් පමණක් සලකා බලා ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

වගු අංක 06 : නව නිපැයුම් සඳහා ලකුණු ලබා දීම (පොදු නිර්ණායක)

| | |
|---|---|
| පේටන්ට් බලපත්‍ර තිබීම/ ප්‍රථම ස්ථානය | ලකුණු 10 |
| දෙවන ස්ථානය | ලකුණු 8 |
| තෙවන ස්ථානය | ලකුණු 6 |
| කුසලතා | ලකුණු 4 |

**උපරිම ලකුණු 10**

### 6.2.1.3. ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ

අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා ශාඛාව මගින් හෝ එම ශාඛාවේ සම්බන්ධීකරණයෙන් හෝ පවත්වනු ලැබූ **සමස්ත ලංකා මට්ටමේ ක්‍රීඩා** තරගවලින් උපරිම වශයෙන් කේවල හා /හෝ කණ්ඩායම් තරග තුනක් පමණක් සලකා බලන අතර අදාළ වර්ෂයට ආසන්න අනුයාත වසර 4ක් තුළ දී ලබා ගත් ජයග්‍රහණ පමණක් සලකා බලා වගු අංක 07ට අනුව කේවල තරග සඳහා ද වගු අංක 08ට අනුව කණ්ඩායම් තරග සඳහා ද ලකුණු ලබා දෙනු ලැබේ.

**වගු අංක 07:කේවල ක්‍රීඩා සඳහා ලකුණු ලබා දීම (පොදු නිර්ණායක)**

| ස්ථානය | එක් තරගයක් සඳහා ලකුණු* |
|---|---|
| 1 | 3 |
| 2 | 2 |
| 3 | 1 |

* ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක යථෝක්ත වසරවල දී සහභාගි වූ වයස් කාණ්ඩ යටතේ සහභාගි වූ තරග අතරින් පළමු ස්ථාන තුනක් හෝ ඊට වැඩි ගණනක් ලබා ගෙන ඇත්නම් ප්‍රසාද ලකුණක් ඇතුළුව ලකුණු 10ක් ලබා දෙනු ලැබේ.

**වගු අංක 08: කණ්ඩායම් ක්‍රීඩා සඳහා ලකුණු ලබා දීම (පොදු නිර්ණායක)**

| ස්ථානය | එක් තරගයක් සඳහා ලකුණු | |
|---|---|---|
| | නායක | සාමාජික |
| 1 | 3 | 2 |
| 2 | 2 | 1 |
| 3 | 1 | 0 |

**උපරිම ලකුණු 10**

## 6.2.2 පොදු නිර්ණායක II කොටස

### 6.2.2.1 වෙනත් ක්ෂේත්‍රයකින් ලබා ඇති /දක්වන ලද අන්තර්ජාතික මට්ටමේ දක්ෂතා

ඉල්ලුම් කරනු ලබන කාණ්ඩයට අමතර වශයෙන් සහභාගි වූ එක් තරගයක්/ ක්‍රියාකාරකමක් පමණක් මේ යටතේ සලකා බැලිය යුතු ය.

| | | |
|---|---|---|
| පළමු ස්ථානය /රන් පදක්කම | - | ලකුණු 07 |
| දෙවනස්ථානය/රිදී පදක්කම | - | ලකුණු 05 |
| තෙවනස්ථානය/ලෝකඩ පදක්කම | - | ලකුණු 03 |
| සහභාගිත්වය | - | ලකුණු 01 |

**උපරිම ලකුණු 07**

### 6.2.2.2 විෂය සමගාමී ක්‍රියාකාරකම්

පහත සඳහන් විෂය සමගාමී ක්‍රියාකාරකම් පමණක් මේ යටතේ සලකා බැලිය යුතු ය.

**වගු අංක 09: විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දීම**

| | | |
|---|---|---|
| බාලදක්ෂ | දිසා කොමසාරිස් ප්‍රදානය හෝ ඊට වැඩි මට්ටම | ලකුණු08 |
| බාලදක්ෂිකා | පළමු පෙළ සාර්ථක ව නිම කළ බාලදක්ෂිකාවක් වීම | |
| ශිෂ්‍යභට | සාජන්ට් | |
| පරිසර නියමු | ස්වර්ණවර්ණ පදක්කම හෝ ඊට වැඩි | |
| බාලදක්ෂ | සහාය දිසා කොමසාරිස් ප්‍රදානය | ලකුණු04 |
| බාලදක්ෂිකා | දෙවන පෙළ සාර්ථක ව නිම කළ බාලදක්ෂිකාවක් වීම | |
| ශිෂ්‍යභට | කෝප්‍රල් | |
| පරිසර නියමු | රජත පදක්කම | |

**උපරිම ලකුණු08**

### 6.2.2.3 භාෂා, ගණිතය, විද්‍යාව ඇතුළු අනෙකුත් විෂයයන් ආශ්‍රිත ක්‍රියාකාරකම්

අධ්‍යාපන අමාත්‍යාංශය හා සම්බන්ධ ව සමස්ත ලංකා මට්ටමෙ ක්‍රියාත්මක කරනු ලබන නිර්මාණශීලීත්වය හා තාර්කික චින්තනය පදනම් වූ කාව්‍ය රචනා, කෙටි කථා, රචනා, විවාද, කථික, ගණිත හා විද්‍යා ඔලිම්පියාඩ් වැනි ක්‍රියාකාරකම් /තරග මෙහි දී සලකා බැලිය යුතු ය. එමෙන් ම අදාළ වර්ෂයට ආසන්න අනුයාත වසර 4ක් තුළ දී ලබා ගත් ජයග්‍රහණ 2ක් පමණක් සලකා බලා වගු අංක 10 අනුව ලකුණු ලබා දිය යුතු ය.

**වගු අංක 10: භාෂා, ගණිතය, විද්‍යාව ඇතුළු අනෙකුත් විෂයයන් සඳහා ලකුණු ලබා දීම**

| ස්ථානය | ලබා දෙන ලකුණු |
|---|---|
| 1 | 5 |
| 2 | 3 |
| 3 | 2 |

**උපරිම ලකුණු10**

### 6.2.2.4 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරකම්

අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාවේ සම්බන්ධීකරණය ඇති ව සමස්ත ලංකා මට්ටමේ ක්‍රියාත්මක කරන ලද මෘදුකාංග නිර්මාණය, වෙබ් අඩවි නිර්මාණය ආදි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තරග මෙහි දී සලකා බැලිය යුතු ය.

**වගු අංක 11: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දීම**

| ස්ථානය | ලබා දෙන ලකුණු |
|---|---|
| 1 | 5 |
| 2 | 3 |
| 3 | 2 |

**උපරිම ලකුණු 05**

### 6.2.2.5 නිර්මාණශීලිත්වය ආශ්‍රිත ක්‍රියාකාරකම්

පොත්/ ලිපි ප්‍රකාශනය කර තිබීම, සීඩී, චිත්‍රපට, ටෙලිනාට්‍ය වැනි නිර්මාණ සඳහා රංගනයෙන්, ගායනයෙන් හෝ වෙනත් ආනුෂාංගික අංගයකින් දායක වී තිබීම ආදී ක්‍රියාකාරකම් මෙහි දී සලකා බලනු ලබන අතර අදාළ වර්ෂය ට ආසන්න අනුයාත වසර 4ක් තුළ ලබා ගෙන ඇති ජයග්‍රහණයක් /කුසලතා ඇගයීමක් පමණක් සලකා බැලිය යුතු ය. (මෙහිදී තහවුරු කිරීම සඳහා පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය).

| |
|---|
| උපරිම ලකුණු 05 |

### 6.2.2.6.අ.පො.ස.(උ.පෙළ)ට ඇතුළත් වීමට අදාළ අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල

**වගු අංක 12: අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල සඳහා ලකුණු ලබා දීම.**

| | |
|---|---|
| ඕනෑ ම විෂයන් 6කට හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සඳහා A සාමාර්ථ හා අනෙකුත් විෂයන්ට B/C මිශ්‍ර ව ලබා තිබීම. | ලකුණු 5 |
| ඕනෑ ම විෂයන් 4ක් හෝ 5ක් හෝ සඳහා A සාමාර්ථ හා අනෙකුත් විෂයන්ට B/C මිශ්‍ර ව ලබා තිබීම. | ලකුණු 4 |
| ඕනෑ ම විෂයන් 2ක් සඳහා A සාමාර්ථ හා අනෙකුත් විෂයන්ට B/C/S මිශ්‍ර ව ලබා තිබීම. | ලකුණු 3 |
| සම්මාන සාමාර්ථ 3 ක් සහිත ව සියලු ම විෂයන් සමත් වී තිබීම. | ලකුණු 2 |

| |
|---|
| උපරිම ලකුණු 05 |

| |
|---|
| **මුළු ලකුණු 100** |

## 07. ශිෂ්‍යත්ව ප්‍රදානය

7.0 අ.පො.ස. (උ.පෙළ) ඉගෙනුම ලබන අවුරුදු 2ක කාල සීමාව තුළ එක් මාසයකට රු.2500/= බැගින් ශිෂ්‍යත්ව වාරික 20ක් ලබා දෙනු ලැබේ. අදාළ මුදල ශිෂ්‍යත්වලාභියාගේ නමට විවෘත කරනු ලබන බැංකු ගිණුමකට සෘජු ව ම ප්‍රේෂණය කරනු ලැබේ.

7.1 මෙම ශිෂ්‍යත්වලාභීන් අඛණ්ඩ ව අධීක්ෂණය කිරීම සඳහා අදාළ පාසල මඟින් සුදුසු ගුරුවරයෙකු පත් කළ යුතු අතර එම ගුරුභවතා ශිෂ්‍යත්වලාභියාට නිසි මඟපෙන්වීම සිදු කළ යුතු ය.

7.2 අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් මෙම ශිෂ්‍යත්වය සඳහා තෝරා ගත් සිසු සිසුවියන්ගේ නම් අදාළ පාසල වෙත දැනුම් දුන් පසු විදුහල්පති විසින් මෙම ශිෂ්‍යත්වලාභීන් අදාළ විදුහලේ අඛණ්ඩව ඉගෙනුම ලබන බවට හා ශිෂ්‍යත්වය ලබා දීම යෝග්‍ය බව තහවුරු කෙරෙන ලිපියක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට ද පිටපතක් සහිත ව අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව වෙත ලබා දීමට කටයුතු කළ යුතු වේ. ඉන් පසු ශිෂ්‍යත්ව ප්‍රදානය සිදු කරන අදාළ කාල සීමාව තුළ දී ද අදාළ ශිෂ්‍යත්වලාභියා එම පාසලේ අඛණ්ඩ ව අධ්‍යාපනය ලබන බවට ලිපියක් ත්‍රෛමාසික ව විදුහල්පති විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට ද පිටපතක් සහිත ව අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව වෙත ලබා දීමට කටයුතු කළ යුතු වේ.

7.3 අදාළ ශිෂ්‍යත්වලාභියා යම් හේතුවක් නිසා ඉගෙනුම ලබන පාසලෙන් ඉවත් ව වෙනත් පාසලකට ඇතුළත් ව ඇත්නම්, ඒ බව තහවුරු කෙරෙන ලිපියක් විදුහල්පති විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට ද පිටපතක් සහිත ව අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව වෙත යොමු කළ යුතු ය.

## 08. ශිෂ්‍යත්වය අවලංගු විය හැකි අවස්ථා

8.1 පහත සඳහන් අවස්ථා හා හේතු පිළිබඳ සලකා බලා සිසුන්ට ලබාදෙන ශිෂ්‍යත්ව අවලංගු කිරීමේ බලය අධ්‍යාපන ලේකම් සතු වේ.

I. ශිෂ්‍යත්වලාභියා විනය විරෝධී හැසිරීම සඳහා දඬුවම් ලැබීම.
II. අඛණ්ඩ ව පාසලට නොපැමිණීම.
III. අඛණ්ඩ අධ්‍යාපන කටයුතුවලින් බැහැර වීම.
IV. අ.පො.ස.(උ.පෙළ) අධ්‍යාපනය සම්පූර්ණ නොකර පාසලෙන් ඉවත් වීම.

මෙම චක්‍රලේඛයෙන් පැන නගින ඕනෑ ම ගැටලුවක් සම්බන්ධයෙන් අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය